# ජවිපෙ දෙමළ විරෝධි වෛරය කොසොවො තත්වයකට පාර කපනවා

ගෝලීය බලවතුන් ලංකා දේශපාලනයට තදින්ම ඇතුල්වෙලා. රනිල්, මහින්ද දෙන්නටම දැන් ඒ අය කියන විදියට වැඩ කරන්න සිද්ධ වෙලා.

මේ බලවතුන් දැන් මේ බලපෑම් කරන්නෙ බොහොම මානව හිතවාදී අය බව පෙන්වමින්. එක්සත් ජාතීන්ගේ සංගමයත් මහ බලවතුන්ගේ උපකරණයක් මිස සියළු ලෝක ප්‍රජාවගේ අදහස දක්වන ආයතනයක් නෙවෙයි.

නමුත් ලෝක ප්‍රජාවගේ ලේබල් එක ගහගෙන ගෝලීය ධනපති බලය එතුළින් ක්‍රියාත්මක වෙනව. මේ සියළු බලපෑම් දැන් එන්නෙ රටට සාමය ඇති කිරීම ගැන අහවමින්.

මේ මැදිහත් වීම ගැන ජනතා විමුක්ති පෙරමුණේ සෝමවංශ අමරසිංහ මෙහෙම කියනව.

"අපි බොහොම කැමැතියි ජනාධිපතියි විපක්ෂ නායකයයි එකතු වෙනවට. මේ දෙන්නට එකතු වෙන්නට පුළුවන් නම් හොඳයි. හැබැයි මේ දෙන්නව එකතු කරන්නෙ කවුද කියල බලන්න ඕන. එකතු කරන්නෙ ඉංදියාව නම්, ඉංදියාවේ මහ කොමසාරිස්වරයා නම්, එකතු කරන්නෙ බටහිර අධිරාජ්‍යවාදීන්ගේ නියෝජිතයන් නම් අන්න ඒකට අපි විරුද්ධයි. ඔය එකතු වෙන්නෙ මේ රටේ ජාතික සමගිය හදන්න නෙවෙයි, දහතුන් වන සංශෝධනය ක්‍රියාවට නැංවීමටයි."

තව දුරටත් මෙහෙමත් කියනව.

"දැන් මේ රටේ ඉන්නේ බටහිරට යට වුණු, අතට අත දියන් කිව්වම දෙන, අයින් වෙයන් කිව්වම අයින්වෙන නායකයෝ විතරයි."

ජනතා විමුක්ති පෙරමුණ එකපාරටම රත්වෙලා තියෙනව මේ මහින්ද-රනිල් එකමුතුව ඉංදියාව ඇතුළු ලෝක ධනපති බලවතුන්ගෙ උවමනාව උඩ වෙන එක ගැන.

මේ උන්දලා එක අතකින් හිතුවෙ මහින්ද රාජපක්ෂ ගෝලීය උවමනාව උඩ නටවන්න පුලුවන් කෙනෙක් නෙවෙයි කියලයි. අනෙක් අතට ඔවුන් කිව්වේ දෙමළ ජනතාවගේ ස්වපාලන අයිතීන් ගැන කථා කිරීම ගෝලීය බලවතුන්ගේ උවමනාව උඩ වෙන දෙයක් කියලයි.

අද වෙනකොට පේනව මේ දෙකම මොන තරම් බොළඳ විශ්වාසයන්ද කියල.

මෙච්චර දවස් මහින්ද දෙමළ විමුක්තියට විරුද්ධව හමුදා මර්ධන දියත් කළෙත් ලෝක බලවතුන්ගේ උපකාර ඇතිව. එහෙම නම් දැන් මේ දහතුන් වන ව්‍යවස්ථා ප්‍රෝඩාව ගෙනෙන්නේ ඒ උන්දලගෙම උවමනාව උඩයි.

ඇත්තටම යුද්ධයට උපකාර කළේ හොර රහසේ, ලෝක වැඩ කරන ජනතාවගේ හඬට බයෙන්. දැන් දහතුන් වන ව්‍යවස්ථා ප්‍රෝඩාවට පැනල තියෙන්නෙ එළිපිට ලොකු සාම වැඩක් බව පෙන්වමින්.

මේ විදියට මේ රටට ගෝලීය බලවතුන් කඩා වදින එක ගැන ලොකුම විත්තිකාරයා ජනතා විමුක්ති පෙරමුණමයි. ඊනියා සිංහල බෞද්ධ ජාතික රාජ්‍යය ගොඩනැගීම වෙනුවෙන් වැඩිම දර දිය ඇද්දෙ ජනතා විමුක්ති පෙරමුණයි.

දැන් එම රාජ්‍ය බලය යොදන්නෙ ගෝලීය ධනපති උවමනාවන් ඉටු කිරීමටයි. එය මෙහෙයවීම මහින්ද-රනිල් යුගලට බාර දීල තියෙනව.

දෙමළ ජාතික සටනට දේශපාලන විසඳුම් දීමට වැඩියෙන්ම විරුද්ධ වුණේ, විරුද්ධ වෙන්නෙ ජනතා විමුක්ති පෙරමුණයි. අද ගෝලීය ධනවාදය දෙමළ ජනතාවට යුක්තිය ඉටු කිරීම ගැන ව්‍යාජ සූත්‍ර අමුණගෙන කඩා පනින්නේ ජනතා විමුක්ති පෙරමුණ දෙමළ ජාතික ප්‍රශ්නය අපට විසඳගන්න ඉඩ නොදුන් නිසයි.

මේ විදියට ගෝලීය ධනවතුන්ගේ කඩා පැනීමට ඉනිමං බැන්ද ජනතා විමුක්ති පෙරමුණට උන්ගෙන්ම බැට වදින බව පෙනෙන කොට කාලකණ්නි සතුටකුත් අපට ඇති වෙනව.

දහතුන් වන ව්‍යවස්ථා සංශෝධනය මහින්ද - රනිල් ජෝඩුව දැන් ගෙනෙන්නෙ ගෝලීය බලවතුන්ගෙ (ඉංදියාව ඇතුළුව) උවමනාව උඩ බව ඇත්ත. ඒත් එදා පාළාත් සභා ආවේ උතුරු-නැගෙනහිර දෙමළ පාළාත් සභාවක් හැටියට එකක් හදල බලතල ගැනත් ලොකු බලාපොරොත්තු ඇති කරලයි.

දැන් විසි අවුරුද්දකට පස්සෙ දෙමළ නිජ බිම දෙකට කඩල, බලතල පුස් බව එළිදරව් වුණ පළාත් සභා දෙකක් ගෙනෙන්නටයි මේ හදන්නෙ. මේකට හැම දෙමළ නායකයෙක්ම විරුද්ධයි. ඇත්තටම මේකට එකඟ විමල් වීරවංශලාගෙ බඩබැඳගත් මිතුරෙක් වුණ ඩග්ලස් විතරයි.

මේ විදියට දෙමළ විමුක්ති සටන දෙපළු කරල හිතවත් දෙමළ ධනපති නායකයින්ට පමණක් තනතුරු බෙදන මේ වැඩපිළිවෙලට ජනතා විමුක්ති පෙරමුණ විරුද්ධ ඇයි? එදාට වඩා අද ඉතාම හොඳින් පෙනෙනව ගෝලීය බලවතුන් වගේම ඉංදීය නායකයින් වැඩට බැහැල තියෙන්නේ දෙමළ විමුක්තිය ආරක්ෂා කරන්න නෙවෙයි, උන්ව දෙපළු කරල දෙමළ හෙංචයියන්ට බලතල පැවැරීමට කියල. මේකට මොන හත්තිලව්වටද විමල්ල දැන් විරුද්ධ වෙන්නෙ.

ජනතා විමුක්ති පෙරමුණ කියන්නෙ රනිල් මහින්ද දෙන්නම බටහිරට යට වුණු අතට අත දීපන් කිව්වහම දෙන, අයින් වෙයන් කිව්වම අයින් වෙන නායකයො කියල නම් අන්න එතැනදි අපට එකඟ වෙන්න පුළුවන්.

මේ වගේ රූකඩ නායකයෝ පත්තා දැමීමට සටනක් දියත් වෙනව නම් සමහර විට ප්‍රභාකරන් වුණත් විමල්ලට උදව් වෙන්න පුළුවන්. මොකද? තමන්ට උතුරු-නැගෙනහිර බලයට පොටක් පැදෙනව නම් දකුණට හිටලර්ලා ආවත් කමක් නෑ කියල උන්නැහේ කියන්න ඉඩ තියෙනව.

මං හිතන්නෙ නැහැ එවැනි ගමනකට විමල්ල යනව කියල. ඒ නිසා තමයි තමන්ගෙ විරෝධය ගෝලීය බලවතුන්ට එල්ල නොකර ඉංදියාවට විතරක් යොමු කරන්නෙ.

මොකද? ඉංදියාව කිව්ව ගමන් සාමාන්‍ය සිංහලයින්ගෙ ඔළුවට නැගෙන්නෙ හින්දු දෙමළ බලවේග ගැනයි. ඒ හරහා ගොඩ නැගෙන්නේ දෙමළ විරෝධී වෛරයයි. ඒ වෛරය එල්ල වෙන්නේ මූලිකවම කොළඹ අවට දැන් පදිංචි වෙලා ඉන්න ලක්ෂ පහකටත් වැඩි උතුරු-නැගෙනහිර ජනතාවටයි.

මේ විදියට වෛරය අවුස්සලා ගැටුම් ඇති වුණොත් දෙමළ අය උතුරු-නැගෙනහිරට යන්න පුළුවන්. එතකොට ඇති වෙන්නේ කොසොවා තත්වයයි. සියළු උතුරු-නැගනෙහිර දෙමළ අය ඒ පළාත්වලටම ගියොත් වෙනම දෙමළ ඊළමක් කියන අදහස හොඳටම තහවුරු වෙනව. විමල්ලගේ ජාතිවාදී ඇවිස්සිල්ලේ ප්‍රතිඵලය එය වෙන්න පුළුවන්.